JSS 2025 3(2): 184-193

Journal of Social Sciences (JSS)
Volume 03 – Issue 02

12

# A RESEARCH-BASED ANALYSIS OF SOCIAL WORK STRATEGIES TO PROMOTE THE WELL-BEING AND DEVELOPMENT OF CHILDREN OF INCARCERATED PARENTS IN SRI LANKA

## ශ්‍රී ලංකාවේ සිරගත දෙමාපියන්ගේ දරුවන්ගේ යහපැවැත්ම සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා සමාජ වැඩ උපාය මාර්ගවල ගවේෂණාත්මක විග්‍රහයක්

**Wijesekera, Manjula**

**School of Social Work, National Institute of Social Development, Liyanagemulla, Seeduwa, Sri Lanka**
**ORCID: https://orcid.org/0009-0002-5833-4065**
**Email: manjula@nisd.ac.lk**

## ABSTRACT

*Children of incarcerated parents in Sri Lanka represent a highly vulnerable social group requiring significant attention regarding their well-being, development, and social support. This paper, grounded in Bronfenbrenner's Ecological Systems Theory, analytically explores social work strategies that can be implemented to promote the holistic well-being and development of these children. The imprisonment of a parent often leads to the breakdown of family relationships, economic instability, social stigma, and educational disparities, all of which adversely affect the psychosocial growth of the child. According to Bronfenbrenner's theoretical framework, social workers can identify and intervene across multiple environmental levels that influence a child's life, addressing the dynamic interactions within and between these systems. The study employs a qualitative approach, integrating data from semi-structured interviews with social workers and a literature review of existing interventions designed for children of incarcerated parents. Participants include professionals with direct experience in child welfare and those working closely with children of imprisoned parents. This study is expected to contribute to the field of social work and its future practice by providing evidence-based recommendations for interventions that enhance the emotional well-being of children affected by parental incarceration. Moreover, it aims to inform future policy development, guide social work practice, and advocate for the establishment of supportive systems and programs tailored to this marginalized group.*

**Keywords:** Incarcerated Parents, Social Work Strategies, Emotional Well-Being, Child Well-Being

**සාරසංක්ෂේපය**

*ශ්‍රී ලංකාවේ සිරගත දෙමාපියන්ගේ දරුවන් යනු අසීමිත අවදානම් සහිත සමාජ කාණ්ඩයකට අයත් වන අතර, ඔවුන්ගේ යහපැවැත්ම, සංවර්ධනය හා සමාජ අනුග්‍රහය පිළිබඳව දැඩි අවධානයක් අවශ්‍ය කරයි. මෙම ලිපිය Bronfenbrennerගේ පරිසර පද්ධති න්‍යායමය (Ecological Systems Theory) මත පදනම්ව, සමාජ වැඩකරුවන්ට මෙම දරුවන්ගේ සම්පූර්ණ යහපැවැත්ම සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි උපාය මාර්ග ගවේෂණාත්මකව විග්‍රහ කරයි. සිරගත වීමෙන් පසු පවුලේ සම්බන්ධතා බිඳීම, ආර්ථික අසමතුලිතතාවය, සමාජ නින්දාව සහ අධ්‍යාපනික අසමතුලිතතාවයන් දරුවන්ගේ මනෝසමාජීය වර්ධනයට බලපායි. Bronfenbrennerගේ මූලධර්මය අනුව, සමාජ වැඩකරුවෙකුට දරුවාගේ ජීවිතය බලපාන මට්ටම් අතර අන්තර්ක්‍රියාකාරී සබඳතා හඳුනා ගනිමින්, පරිසර පද්ධති සම්පූර්ණ වශයෙන් හඳුනාගෙන ක්‍රියාමාර්ග ගත හැක සමාජ වැඩකරුවන් සමඟ අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සහ සිරගත කරන ලද දෙමාපියන්ගේ දරුවන් සඳහා මැදිහත්වීම් පිළිබඳ පෙර පවතින අධ්‍යයනයන් පිළිබඳ සාහිත්‍ය සමාලෝචනයක් සිදුකරමින් එකී දැනුමද ඒකාබද්ධ කරමින් සිදුකිරීම සඳහා පර්යේෂණය ගුණාත්මක ප්‍රවේශයක් භාවිතා කරන ලදී. නියැදියට ළමා සුභසාධනය පිළිබඳ සෘජු අත්දැකීම් ඇති සහ සිරගත කරන ලද දෙමාපියන්ගේ දරුවන් සමඟ වැඩ කිරීමේ වෘත්තිකයින් ඇතුළත් වේ. මෙම අධ්‍යයනය සමාජ වැඩ ක්ෂේත්‍රයට සහ එහි අනාගත පැවැත්මට දායක වනු ඇතැයි අපේක්ෂා කරමි. සිරගත කරන ලද දෙමාපියන් සිටින දරුවන්ගේ චිත්තවේගීය යහපැවැත්ම වැඩිදියුණු කළ හැකි මැදිහත්වීම් සඳහා සාක්ෂි මත පදනම් වූ නිර්දේශ ලබා දීම, සමාජ වැඩ ක්ෂේත්‍රයේ අනාගත භාවිතයන් සහ ප්‍රතිපත්ති යෝජනා කිරීම මෙන්ම නව ප්‍රතිපත්ති සම්පාදනය උදෙසා සහාය වීම මෙමගින් සිදුවේ.*

**මුඛ්‍ය පද :**සිරගත කරන ලද දෙමාපියන්, සමාජ වැඩ උපාය මාර්ග,චිත්තවේගීය යහපැවැත්ම, ළමා සුභසාධනය

## 1.හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සිරගත පවුල් ගැටලුව සමාජීය හා ආර්ථික මට්ටමින් ගැඹුරු හා සංකීර්ණ තත්ත්වයකි. පවුලක් තුළ එක් දෙමාපියෙකු හෝ දෙදෙනාම සිරගත වීමෙන් පසු පවුලේ සම්මත භූමිකාවන් බිඳීම, ආර්ථික අස්ථාවරතාවය, සහ දරුවන්ගේ අධ්‍යාපනික හා මනෝසමාජීය පරිසරය කෙරෙහි බලපෑමක් ඇති වීම නිතර දක්නට ලැබේ. පවුල ශ්‍රී ලාංකික සමාජයේ මූලික සහායක පද්ධතියක් වන බැවින්, දෙමාපියන්ගෙන් යම් අයෙකු සිරගත වීම දරුවාගේ යහපැවැත්ම හා සංවර්ධනයට දැඩි හා දිගුකාලීන බලපෑමක් ඇති කරයි.

ආන්තර්ජාතික පර්යේෂණ අනුව (Arditti, 2012; Murray & Farrington, 2008), සිරගත දෙමාපියන්ගේ දරුවන් අධ්‍යාපනික අසාර්ථකතා, අධි පීඩනය, සමාජයෙන් තොරවීම, විරෝධාත්මක හැසිරීම්, සහ මානසික පීඩන වැනි ගැටළු මුහුණ දීමට වැඩි අවදානමක් ඇත. මෙම පීඩන මනෝසමාජීය පරිසරය පමණක් නොව, ඔවුන්ගේ ආර්ථික සහ පවුල් සම්බන්ධතා පද්ධතිය ද බිඳ දැමිය හැක.

දෙමාපිය සිරගත වීම ශ්‍රී ලංකාවේ වැඩිවෙමින් පෙනෙන නමුත් තවමත් අධ්‍යයනයට ලක් නොවූ සමාජ ගැටලුවකි. ජාතික මට්ටමින් දරුවන්ගේ නිශ්චිත සංඛ්‍යාව පිළිබඳ පරාස ලක්ෂණ දීර්ඝ නොවූ නමුත් ගෝලීය පර්යේෂණයන් පෙන්වා දෙන්නේ මිලියන ගණනක් දරුවන් අවම වශයෙන් එක් දෙමාපියෙකු හෝ බන්ධනාගාරයක ජීවත් වන බවය (UNODC, 2021). ශ්‍රී ලංකාවේදී මත්ද්‍රව්‍ය අපයෝජනය, ප්‍රචණ්ඩත්වය, දේශපාලන හේතු, සහ ආර්ථික අපරාධ නිසා බහුලව සිරගත කිරීම් සිදුවෙයි. මේ හේතු නිසා පවුලේ සම්මත ව්‍යුහය බිඳී යාමත් සමඟ දරුවන් විශාල මානසික හා ආර්ථික පීඩනයකට ලක් වේ. බොහෝ විට ඔවුන් විස්තෘත පවුලේ සාමාජිකයන් හෝ රාජ්‍ය ළමා ආරක්ෂණ ආයතනවල ජීවත් වීමට සිදුවෙයි (පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, 2022).

මේ අනුව දෙමාපියන් සිරගත කිරීමෙන් පසු දරුවන්ට ඇති බලපෑම් බහුමානීය හා දිගුකාලීන වේ. විදෙස් පර්යේෂණවලින් පෙන්වා දී ඇති පරිදි (Murray & Farrington, 2008; Arditti, 2012), මෙවැනි දරුවන්ට චිත්තවේගීය කම්පනය, බැඳීම් බාධා, පාසල් හැරයාම, සහ දරිද්‍රතාවයට ඇද වැටීමේ ඉඩකඩ වැඩිය. සම වයසේ මිතුරන් හා ප්‍රජා පද්ධති විසින් ඔවුන්ට අපකීර්තියක් සහ ලැජ්ජාවක් ඇති කිරීමත් සමඟ ඔවුන්ට හුදකලාව හා විශ්වාස හීනයක් මතුවේ. රැකබලා ගැනීමේ බර බොහෝ විට වයෝවෘද්ධ මවන් හෝ තනි ආරක්ෂකයන් මත පැටවීමත් ඔවුන්ගේ සංවර්ධනයට අවාසනාවන්ත බලපෑමක් ඇති කරයි (Robertson, 2007; UNICEF Sri Lanka, 2019).

එමෙන්ම, දෙමාපියන්ගේ සිරගත වීම පවුලේ ආර්ථික ආදායම අඩු කිරීමක් පමණක් නොව පවුලේ සම්බන්ධතා හා ආදරයේ නිරන්තරතාවද බිඳ දමයි. සමාජයෙන් ලැබෙන අපකීර්තිය හා වෙන්වීමේ හැඟීම ඔවුන්ගේ මානසික සෞඛ්‍යය ඉතා නරක ලෙස බලපායි. මේ නිසා මෙම දරුවන් බොහෝ විට ආදරණීය සබඳතා නැතිව, සමාජ ආධාර පද්ධති වලින් තොරව ජීවත් වෙති.

ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CRC) අනුමත කර තිබියදීත්, එහි නියමයන් අනුව සිරගත කරන ලද දෙමාපියන්ගේ දරුවන්ට ආරක්ෂාව සහ නිරන්තර සම්බන්ධතා රැකවරණය කළ යුතුය (UNCRC, 1989; UNICEF, 2017). එහෙත්, දේශීය පරිසරය තුළ මෙම දරුවන්ගේ අයිතිවාසිකම් ප්‍රායෝගිකව අසමාන ලෙස සැලකේ. නීතිමය හා ප්‍රතිපත්තිමය ආරක්ෂණ පද්ධතිය වැඩි දියුණු වුවද, සිරගත දෙමාපියන්ගේ දරුවන්ට විශේෂිත මැදිහත් ක්‍රම හා සමාජ වැඩ මගින් සහාය සැලසීම අවම මට්ටමක පවතී.

ඒ අනුව, මෙම පර්යේෂණය සිරගත දෙමාපියන්ගේ දරුවන්ගේ යහපැවැත්ම හා සංවර්ධනය උදෙසා සමාජ වැඩ මගින් ඉටු කළ හැකි උපාය මාර්ග ගවේෂණය කිරීමට අරමුණු කරයි. සමාජ වැඩකරුවන්ට මෙම පවුල් හා දරුවන් සඳහා ඍජු මැදිහත්වීම්, උපදේශන සේවා, ප්‍රජා සවිබල ගැන්වීම් හා ප්‍රතිපත්තිමය මට්ටමේ මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමෙන් ඔවුන්ගේ ජීවිත ගුණාත්මකභාවය වැඩිදියුණු කළ හැක.

එමෙන්ම, චිත්තවේගීය සහ මානසික පීඩනවලට මුහුණ දෙන මෙම දරුවන්ට දීර්ඝකාලීන සහයෝගී ජාලයක් පිහිටුවීමත් ඉතාමත් වැදගත්ය. ගෝලීය පර්යේෂණවල (Phillips et al., 2006; Shlafer & Poehlmann, 2010) පෙන්වා දී ඇති පරිදි, සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් — උදාහරණ ලෙස පාසල් උපදේශන වැඩසටහන්, පවුල් නැවත ඒකාබද්ධ කිරීමේ සැලසුම්, සහ

ප්‍රජා මනෝසමාජීය සහයෝගී කණ්ඩායම් දරුවන්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීමට ඵලදායී පරිදි දායක වේ.

ශ්‍රී ලාංකික සන්දර්භය තුළ, මේ ආකාරයේ සමාජ වැඩ මැදිහත්වීම් සංස්කෘතික හා සමාජීය වශයෙන් ගැළපෙන පරිදි සංවර්ධනය කිරීම අත්‍යවශ්‍යය. දෙමාපියන් සිරගත කිරීමේ බලපෑම් පරම්පරා අතර පවත්නා අපරාධ චක්‍රය, දරුවන්ගේ ආකල්ප, සහ සමාජය සමඟ ඇති සබඳතා ද බලපාන බැවින්, සමාජ වැඩකරුවන්ට මෙය සවිස්තරාත්මකව අධ්‍යයනය කළ යුතු ක්ෂේත්‍රයකි.

මෙම පර්යේෂණය ශ්‍රී ලංකාවේ සිරගත දෙමාපියන්ගේ දරුවන් මුහුණ දෙන අභියෝග විග්‍රහ කරමින් ඔවුන්ගේ යහපැවැත්ම සහ සංවර්ධනය උදෙසා Bronfenbrennerගේ පරිසර පද්ධති මූලධර්මය මත පදනම් වූ සමාජ වැඩ උපාය මාර්ග හඳුනා ගැනීමට අවධානය යොමු කරයි. මෙහි ප්‍රායෝගික අරමුණ වන්නේ, සමාජ සේවා ආයතන, ප්‍රජා ආධාර පද්ධති සහ රාජ්‍ය යන්ත්‍රණ අතර සම්බන්ධීකරණය ශක්තිමත් කරමින්, සංස්කෘතිකව ගැළපෙන සහ පද්ධතිමය මැදිහත්වීම් සඳහා පදනමක් සැදීමය. ශ්‍රී ලංකාවේ සිරගත දෙමාපියන්ගේ දරුවන් මුහුණ දෙන අභියෝග විග්‍රහ කරමින් ඔවුන්ගේ යහපැවැත්ම සහ සංවර්ධනය උදෙසා Bronfenbrennerගේ පරිසර පද්ධති මූලධර්මය මත පදනම් වූ සමාජ වැඩ උපාය මාර්ග මොනවාද යන පර්යේෂණ ගැටළුව මත පදනම්ව සිදුවේ.

## 02. ප්‍රධාන අරමුණ

01.ශ්‍රී ලංකාවේ සිරගත දෙමාපියන්ගේ දරුවන්ගේ යහපැවැත්ම හා සංවර්ධනය උදෙසා, **Bronfenbrennerගේ පරිසර පද්ධති මූලධර්මය මත පදනම් වූ සමාජ වැඩ උපාය මාර්ග හඳුනා ගැනීම හා විග්‍රහ කිරීම**.

## 02.සුවිශේෂී අරමුණු

1. **සිරගත දෙමාපියන්ගේ දරුවන් මුහුණ දෙන මනෝසමාජීය, අධ්‍යාපනික හා ආර්ථික අභියෝග** Bronfenbrennerගේ පරිසර පද්ධති (microsystem, mesosystem, exosystem, macrosystem, chronosystem) මත පදනම්ව **විග්‍රහ කිරීම**.
2. සංස්කෘතික හා සන්දර්භීය වශයෙන් ගැළපෙන සමාජ වැඩ මැදිහත් උපාය මාර්ග නිර්දේශ කිරීම.

## 03. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක ගවේෂණාත්මක පර්යේෂණ සැලසුමක් තෝරා ගෙන ඇත, මන්ද මෙවැනි ප්‍රවේශයක් සංකීර්ණ සමාජ සංසිද්ධි ගවේෂණය කිරීමට හා සහභාගිවන්නන්ගේ අත්දැකීම්, අර්ථයන් සහ සංජානන පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට සුදුසු වන බැවිනි. ශ්‍රී ලංකාවේ සිරගත දෙමාපියන්ගේ දරුවන් පිළිබඳ පර්යේෂණ පරතරයක් පවතින නිසා, මෙම ගුණාත්මක පර්යේෂණය ඔවුන්ගේ ජීවමාන යථාර්ථයන් අවබෝධ කරගැනීම සහ සංස්කෘතික හා සන්දර්භීයව අදාළ සමාජ වැඩ උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා වටිනා වේ. පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස කොළඹ, ගම්පහ හා මහනුවර දිස්ත්‍රික්කයන් තෝරාගෙන ඇති අතර, ඒවායේ ඉහළ ජනගහන ඝනත්වය, විශෝධන ආයතනවලට සමීපවීම සහ ක්‍රියාකාරී සමාජ සේවා හා ළමා

ආරක්ෂණ සේවා පවතින බව සැලකිල්ලට ගෙන ඇත. දත්තදායනයින් ලෙස වයස අවුරුදු 10 සිට 18 දක්වා වූ සිරගත දෙමාපියන්ගේ දරුවන්, ඔවුන්ගේ ප්‍රාථමික රැකබලා ගන්නන්, සමාජ වැඩකරුවන් , පාසල් උපදේශකයින්, ගුරුවරුන් සහ NGO නියෝජිතයින් තෝරාගත් අතර, අරමුණු සහිත නියැදීම (Purposive Sampling) භාවිතා කරනු ලැබීය. දත්ත රැස් කිරීම සඳහා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා, නාභිගත කණ්ඩායම් සාකච්ඡා (FGDs), සහ ලේඛන සමාලෝචනය යන ක්‍රම භාවිතා කරමින් ත්‍රිකෝණබද්ධකරණය හා විශ්වාසනීයතාවය තහවුරු කරනු ලැබීය. රැස් කරන ලද දත්ත තේමාත්මක විශ්ලේෂණ ක්‍රමය (Thematic Analysis) මගින් විශ්ලේෂණය කර, සහභාගිවන්නන්ගේ ආඛ්‍යාන තුළ සිට පැහැදිලිව අනාවරණය කරගන්නා ලදී. පර්යේෂණයේ සංවේදී භාවය සැලකිල්ලට ගනිමින්, දැනුවත්ව කැමැත්ත හා අනුමැතිය ලබා ගැනීම, නිර්නාමිකභාවය සහ රහස්‍යභාවය රැකීම, සහ මනෝවිද්‍යාත්මක ආරක්ෂාව සුරක්ෂිත කිරීම යන ආචාරාවිද්‍යාත්මක මූලධර්ම දැඩි ලෙස අනුගමනය කරන

**04.**න්‍යායික රාමුව (Theoretical Framework)

Bronfenbrenner (1979) විසින් යෝජනා කළ **පරිසර පද්ධති මූලධර්මය** (Ecological Systems Theory) අනුව, දරුවන්ගේ සංවර්ධනය තනි පුද්ගලයන්ට පමණක් නොව, පවුල, පාසල, ප්‍රජාව සහ සමාජයේ ව්‍යූ ක්‍රම රටාවන්ට ආශ්‍රිත වේ. මෙම පද්ධතිය අනුව, එහි සමාජ වැඩකරුවකුගේ භූමිකාවක් තිබේ. විවිධ පද්ධති මට්ටමින් (Micro සිට Macro දක්වා) හඳුනා ගැනීම්, සම්බන්ධතා ගොඩනැගීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් මෙම දරුවන්ට සහාය දැක්විය හැකිය.

### 4.1 Bronfenbrennerගේ පරිසර පද්ධති මූලධර්මය (Ecological Systems Theory) සහ සමාජ වැඩ භූමිකාව

මෙම ගවේෂණය **Bronfenbrennerගේ පරිසර පද්ධති මූලධර්මය (Ecological Systems Theory)** මත පදනම් වේ. එම මූලධර්මය අනුව, පුද්ගලයාගේ වර්ධනය ඔහු/ඇය පවතින විවිධ පරිසර පද්ධති අතර අන්තර්ක්‍රියා මත රඳා පවතී. එම පද්ධති Microsystem, Mesosystem, Exosystem, Macrosystem, හා Chronosystem දරුවාගේ පරිසරය පිළිබඳ සමස්ත දැක්මක් ලබාදෙයි.

මෙහිදී සිරගත දෙමාපියන්ගේ දරුවන්ට අදාල සමාජ වැඩ උපාය මාර්ග හඳුනා ගැනීම සඳහා මෙම පද්ධති ශ්‍රී ලංකීය පරිසරයට අනුකූල කර විග්‍රහ කළහැකිය.

**Microsystem (සූක්ෂම පද්ධතිය): පවුල, පාසල, සහ මිතුරන්**

Microsystem මට්ටමේදී දරුවාගේ සෘජු සම්බන්ධතා පද්ධතිය සැලකේ. දෙමාපියන්ගෙන් එක් අයෙකු හෝ දෙදෙනාම සිරගත වීම දරුවාගේ දෛනික ආදරණීය සම්බන්ධතා බිඳවැටීමකට හේතු වේ. මේ මට්ටමේදී සමාජ වැඩකරුගේගේ භූමිකාව අතර දරුවාගේ ආරක්ෂාව සහ මනෝසමාජීය ස්ථාවරතාවය තහවුරු කිරීම,භාරකරුවන් (guardians) සමඟ විශ්වාසී සම්බන්ධතාවයක් ගොඩනැගීම,පාසල් ගුරු මණ්ඩලය හා මිතුරන් සමඟ සංවේදී ක්‍රියාමාර්ග සංවිධානය කිරීම,දරුවාට ආදරණීය හා ආරක්ෂිත පරිසරයක් සපයන ව්‍යාපෘති පිහිටුවීම.උදාහරණයක් ලෙස, පවුල් මට්ටමේ "සම්බන්ධතා පුනරුත්ථාපන වැඩසටහන් (family

reintegration programmes)" මඟින් සිරගත වූ දෙමාපියන්ගේ හා දරුවන්ගේ සම්බන්ධතා නැවත ගොඩනැගීම ප්‍රවර්ධනය කළ හැක.

**Mesosystem (මධ්‍යස්ථ පද්ධතිය): පවුල – පාසල – ප්‍රජාව අතර සම්බන්ධතා**

මෙම මට්ටමේදී Microsystem තුළ ඇති විවිධ පද්ධති අතර අන්තර්ක්‍රියා සැලකේ. උදාහරණයක් ලෙස, පාසල හා පවුල අතර සන්නිවේදන අඩු වීම දරුවාගේ අධ්‍යාපනික සහ මානසික ප්‍රගතියට බලපායි. සමාජ වැඩකරුට මෙහිදී කළ හැක්කේ පාසල් සමඟ දරුවන් පිළිබඳ තොරතුරු හුවමාරුව වැඩි කිරීම, හා ගුරු මණ්ඩලය භාරකරුවන් අතර අවබෝධතා වැඩසටහන් සංවිධානය කිරීම ප්‍රජා මට්ටමේ දරුවන්ට සහය වන ජාල (community support networks) නිර්මාණය කිරීම.මෙම මට්ටමේ ක්‍රියාකාරීත්වය සාර්ථක වන්නේ සමාජවැඩකරුගේ සන්නිවේදන කුසලතා සහ පද්ධති අතර සම්බන්ධතා ගොඩනැගීමේ හැකියාව මතය.

**Exosystem (බාහිර පද්ධතිය): ආයතනික හා නීතිමය බලපෑම්**

Exosystem මට්ටමේදී දරුවා සෘජුවම සම්බන්ධ නොවූ නමුත් ඔහුගේ ජීවිතයට බලපාන පද්ධති පිළිබඳව සලකා බැලේ. එමගින් රජයේ සමාජ සේවා, ආයතනික නීති, හා නීතිමය ආධාර පද්ධති ඇතුළත් වේ.මේ මට්ටමේදී සමාජ වැඩකරුගේගේ භූමිකාව අතර බන්ධනාගාරය හා සමාජ සේවා ආයතන අතර සමබර ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීම,දරුවන්ට ආධාර සහ ආරක්ෂාව ලබාදීමේ නීතිමය ක්‍රමයන් සැලසුම් කිරීම,"Case Management System" එකක් හරහා දරුවාගේ අවශ්‍යතා, අභියෝග වෙනුවෙන් පෙනීසිටීමයි.උදාහරණයක් ලෙස, සමාජවැඩකරුවන්ට ආරක්ෂක සේවාවන් හා පවුල් අධ්‍යයන ඒකක සමඟ එක්ව "Child Impact Assessment Framework" ක්‍රියාත්මක කළ හැක, එමගින් සිරගත වීමේ බලපෑම් පාලනය කරනු ඇත.

**Macrosystem (සාර්ව පද්ධතිය): සංස්කෘතික හා ප්‍රතිපත්ති මට්ටම**

Macrosystem මට්ටමේදී සමාජයේ පරිපාලන ආකෘතිය, සංස්කෘතික විශ්වාස, ආගම්, සහ නීති පද්ධති දරුවන්ගේ ජීවිතයට බලපායි. ශ්‍රී ලංකාවේ සිරගත දෙමාපියන්ගේ පවුල් බොහෝ විට සමාජයෙන් වෙන්කරනු ලබන අතර, එය සමාජ අවපාතයක් වර්ධනය කරයි. මේ මට්ටමේදී සමාජ වැඩකරුගේගේ භූමිකාව අතර ජනමාධ්‍ය සහ ප්‍රජා මට්ටමේ අවබෝධ වැඩසටහන් මඟින් සමාජ අවමානය අඩු කිරීම,රජයේ සහ NGO ආයතන සමඟ එක්ව ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කිරීම,"Social Inclusion Advocacy" මඟින් දරුවන්ට සාධාරණ අවස්ථා ලබාදීම සඳහා නීතිමය වෙනසක් උත්තේජනය කිරීම.උදාහරණයක් ලෙස, සිරගත දෙමාපියන්ගේ පවුල් සඳහා විශේෂ "Child Support Grant" ක්‍රමයක් හෝ අධ්‍යාපනික ආධාර අරමුදලක් සකස් කිරීම වැනිකාර්යන් සිදුකළ හැකිවේ.

**3.5 Chronosystem (කාල පද්ධතිය): දිගුකාලීන බලපෑම් සහ ප්‍රතිචාර**

Chronosystem මට්ටමේදී කාලයත් සමඟ පරිසරය තුළ ඇති වෙනස්කම් සැලකේ. සිරගත වීමේ කාලය දිගු වීම, දෙමාපියන්ගේ නිදහස් වීමෙන් පසු පවුල් සම්බන්ධතා නැවත ගොඩනැගීම, සහ දරුවාගේ දිගුකාලීන සංවර්ධන අවශ්‍යතා සියල්ල මෙම මට්ටමේදී සලකා බැලිය යුතුය. මේ

මට්ටමේදී සමාජ වැඩකරුගේගේ භූමිකාව අතර "Follow-up Support Plans" නිර්මාණය කර දරුවාගේ අනාගත අධ්‍යාපනික හා වෘත්තීය මාර්ගය නියම කිරීම,පවුල් පුනරුත්ථාපන කාලය පුරා මනෝසමාජීය උපදේශන සේවා ලබාදීම, නිදහස් වූ දෙමාපියන්ට "Parenting Rehabilitation Programmes" හරහා දරුවන් සමඟ ආදරණීය සම්බන්ධතා නැවත ගොඩනැගීමේ හැකියාව උත්තේජනය කිරීමයි.

## 05. සමාජ වැඩ උපාය මාර්ගවල ගවේෂණාත්මක විග්‍රහය (Analytical Discussion on Social Work Strategies)

ක්‍රියාත්මක කළ හැකි නවතම උපාය මාර්ග පරිසර පද්ධති මූලධර්මය සමඟ සම්බන්ධ ගැලපීම

### 1Family-Centered Intervention

පවුලේ සම්බන්ධතා සහ විශ්වාසය ශක්තිමත් කිරීම, දරුවන්ට ආදරණීය හා ස්ථාවර පරිසරයක් නිර්මාණය කිරීම.

### 2 School-based Psychosocial Support

පාසල් මට්ටමේ උපදේශන වැඩසටහන්, ගුරු පුහුණු කිරීම, සහ දරුවන්ගේ මනෝසමාජීය අභියෝග පිළිබඳ හැඳින්වීම්.

### 3 Community Reintegration Projects

ප්‍රජා මට්ටමේ දරුවන්ට සහ පවුල් එක්ව සහය වන කමිටු පිහිටුවීම, "Community Mentoring" ක්‍රමවේදයන්.

### 4 Policy and Advocacy Work

නීතිමය හා ප්‍රතිපත්ති මට්ටමේ දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, රජයේ සහ NGO ආයතන අතර හවුල් වැඩසටහන්.

### 5 Capacity Building for Social Workers:

සිරගත පවුල් සමඟ ක්ෂේත්‍රීය සේවාවන්ට නව පුහුණු වැඩසටහන් හා විශේෂීකරණ.

මෙම උපාය මාර්ග ශ්‍රී ලංකාවේ සමාජ සේවා ක්ෂේත්‍රයට ගැලපෙන පරිදි අනුකූල කරමින් ක්‍රියාත්මක කළ හැකි අතර, දරුවන්ගේ සම්පූර්ණ සංවර්ධනය සහ මනෝසමාජීය යහපැවැත්ම උත්තේජනය කිරීමට විශාල දායකත්වයක් ලබාදිය හැක.

## 06 නිගමන සහ නිර්දේශ

සිරගත කරන ලද දෙමාපියන්ගේ දරුවන් ශ්‍රී ලංකාවේ ඉතා අවදානමට ලක්විය හැකි සහ බොහෝ විට නොසලකා හරින ලද කණ්ඩායමකි. ඔවුන්ගේ අත්දැකීම් අපකීර්තිය, ආර්ථික අස්ථාවරත්වය, මානසික කම්පනය සහ පවුල් බැඳීම් කඩාකප්පල් වීමතුල හැඩගැසී ඇත. ගෝලීය දැනුවත්භාවය වැඩි වුවද, ශ්‍රී ලාංකික සමාජ ආරක්ෂණ පද්ධති සහ ළමා සුභසාධන සේවා තවමත් මෙම දරුවන්ගේ නිශ්චිත අවශ්‍යතා සම්පූර්ණයෙන් හඳුනාගෙන හෝ ආමන්ත්‍රණය කර නොමැත. මෙම අධ්‍යයනයෙන් අවධාරණය කරන්නේ ඔවුන්ගේ මනෝ සමාජීය සහ සංවර්ධන අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන ළමා කේන්ද්‍රීය, සංස්කෘතික වශයෙන් සුදුසු සහ අයිතිවාසිකම් මත පදනම් වූ

සමාජ වැඩ මැදිහත්වීම් සඳහා ඇති  අවශ්‍යතාවයයි. පාරිසරික පද්ධති න්‍යාය (බ්‍රොන්ෆෙන්බ්‍රෙනර්, 1979) මත පදනම්ව, අධ්‍යයනයෙන් පවුල, පාසල, ප්‍රජාව සහ ජාතික ප්‍රතිපත්ති ඇතුළුව දරුවෙකුගේ පරිසරයේ බහුවිධ ස්වභාවය අවධාරණය කෙරේ. බලපෑමට ලක් වූ දරුවන් සහ රැකබලා ගන්නන් වෙනුවෙන් පෙනී සිටීම, මැදිහත් වීම සහ බලගැන්වීම සඳහා සමාජ වැඩකරුවන්ට  මෙම පද්ධතියේ සෑම මට්ටමකදීම තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට ඇත. ජාත්‍යන්තර යහපත් පිළිවෙත් දේශීය යථාර්ථයන් සමඟ ඒකාබද්ධ කිරීමෙන්, ශ්‍රී ලංකාවට වඩාත් හොඳ ළමා ආරක්ෂණ රාමුවක් කරා ගමන් කළ හැකිය.

**නිර්දේශ**

1. ප්‍රතිපත්ති මට්ටමේ මැදිහත්වීම් සිරගත කර ඇති දෙමාපියන්ගේ දරුවන් හඳුනා ගැනීම සහ සහාය දීම සඳහා ජාතික මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම. මෙම කණ්ඩායම අවදානමට ලක්විය හැකි ළමා කාණ්ඩ යටතේ පැහැදිලිව ඇතුළත් කිරීම සඳහා ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති සංශෝධනය කිරීම. සමස්ථ සේවා සැපයීම සහතික කිරීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම.

2. සමාජ වැඩ අධ්‍යාපනය සහ පුහුණුව කම්පන-දැනුවත්, පවුල් කේන්ද්‍රීය ප්‍රවේශයන් පිළිබඳව වෘත්තිකයන් පුහුණු කර ඇති බව සහතික කිරීම සඳහා මෙම ගැටලුව සමාජ වැඩ විෂය මාලාවට ඒකාබද්ධ කිරීම. පරිවාස නිලධාරීන්, පාසල් උපදේශකයින් සහ ප්‍රජා සේවකයින් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් සංවේදීතාව, රහස්‍යභාවය සහ වෙනස් කොට සැලකීමකින් තොරව භාවිතා කිරීම අවධාරණය කිරීම

3. ආයතනික සහ ප්‍රජා පාදක මැදිහත්වීම් බලපෑමට ලක් වූ දරුවන්ගේ චිත්තවේගීය සහ අධ්‍යයන යහපැවැත්ම නිරීක්ෂණය කිරීම සඳහා පාසල් පාදක ආධාරක පද්ධති (උදා: පාසල් සමාජ වැඩකරුවන්, සම වයසේ මිතුරන් වැනි සහාය කණ්ඩායම්) ස්ථාපිත කිරීම. දරුවන් සහ ඔවුන්ගේ රැකබලා ගන්නන්, විශේෂයෙන් ආච්චිලා සීයලා හෝ ඥාති රැකවරණ සපයන්නන් යන දෙපිරිසටම සහාය වන ප්‍රජා පාදක මනෝ සමාජීය වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම. දෙමාපිය-ළමා සබඳතා ආරක්ෂිත සහ සහායක ආකාරයෙන් පවත්වා ගැනීම සඳහා බන්ධනාගාර තුළ ළමා-හිතකාමී  වැඩසටහන් දිරිමත් කිරීම.

4. දත්ත සහ පර්යේෂණ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සංවර්ධනය සඳහා සිරගත කර ඇති දෙමාපියන්ගේ දරුවන් හඳුනාගෙන නිරීක්ෂණය කිරීම සඳහා ජාතික දත්ත සමුදායක් ස්ථාපිත කිරීම.
ශ්‍රී ලංකා සන්දර්භය තුළ දරුවන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සමාජ ප්‍රතිඵල කෙරෙහි දෙමාපියන් සිරගත කිරීමේ දිගුකාලීන බලපෑම් පිළිබඳ  චිරස්ථායි සහ ගුණාත්මක පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

5. මහජන දැනුවත්භාවය සහ උපදේශනය මෙම දරුවන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා පිළිබඳව අපකීර්තිය අඩු කිරීමට සහ මහජන දැනුවත්භාවය වැඩි කිරීමට මාධ්‍ය ව්‍යාපාර දියත් කිරීම. සමාජ පිළිගැනීම ප්‍රවර්ධනය කිරීමට සහ ආන්තිකකරණය අඩු කිරීමට ආගමික නායකයින්, ප්‍රජා බලගන්වන්නන් සහ රාජ්‍ය නොවන සංවිධාන උපදේශන ප්‍රයත්නයන් සඳහා සම්බන්ධ කිරීම.

## Reference


පෙරේරා, ය. (2013). ශ්‍රී ලංකාවේ ළමා ආරක්‍ෂක ආයතනය සහ ආයතනගත ලැයිස්තුව: යාවත්කාලීන විශ්ලේෂණයක් . ජාතික සමාජ සංවර්ධන ආයතනය.

හේවාවාසම්, එච්. පී. කේ. එන්. (2023). අත්අඩංගුවට ගත් මවන්ගේ මනෝභාවය සහ සමාජීය අභියෝග . විජය පර්යේෂණ සමාජ විද්‍යාව සහ සමාජ විද්‍යා සමාජය.

ආරියදාස, එෂාන්ත. (2014). ශ්‍රී ලංකාවේ ස්වයංක්‍රීය ළමා ආරක්ෂක ආයතනවල ජීවන අවස්ථා . ෆ්ලින්ඩර්ස් විශ්ව විද්‍යාලය.

Save the Children Sri Lanka. (2005). ශ්‍රී ලංකාවේ ආයතනික ආරක්ෂක ආයතනවල ළමා ආරක්ෂණ: "නිවස සත්‍ය" වාර්තාව .

හේවාවාසම්, එච්. පී. කේ. එන්. (2023). අත්අඩංගුවට ගත් මවන්ගේ මනෝභාවය සහ සමාජීය අභියෝග . විජය පර්යේෂණ සමාජ විද්‍යාව සහ සමාජ විද්‍යා සමාජය.

Arditti, J. A. (2012). *Parental incarceration and the family: Psychological and social effects of imprisonment on children, parents, and caregivers*. NYU Press.

Bronfenbrenner, U. (1979). *The ecology of human development: Experiments by nature and design*. Harvard University Press.

Cunningham, A. (2001). *Forgotten families – The impact of imprisonment on dependent children*. Institute for Crime and Justice Policy Research.

Department of Probation and Child Care Services. (2022). *Annual report on child welfare and protection in Sri Lanka*. Government of Sri Lanka.

Hairston, C. F. (2007). *Focus on children with incarcerated parents: An overview of the research literature*. Urban Institute.

Murray, J., & Farrington, D. P. (2008). The effects of parental imprisonment on children. *Crime and Justice*, 37(1), 133–206. https://doi.org/10.1086/520070

Nesmith, A., & Ruhland, E. (2008). Children of incarcerated parents: Challenges and resiliency, in their own words. *Children and Youth Services Review*, 30(10), 1119–1130. https://doi.org/10.1016/j.childyouth.2008.02.006

Phillips, S. D., Burns, B. J., Wagner, H. R., Kramer, T. L., & Robbins, J. M. (2006). Parental incarceration among adolescents receiving mental health services. *Journal of Child and Family Studies*, 15(3), 287–301. https://doi.org/10.1007/s10826-006-9031-4

Robertson, O. (2007). *Children imprisoned by circumstance: Children of incarcerated parents*. Quaker United Nations Office.

Seymour, C. B., & Hairston, C. F. (Eds.). (2001). *Children with parents in prison: Child welfare policy, program, and practice issues*. Transaction Publishers.

Sharma, R. (2020). Community-based interventions for children of incarcerated parents in South Asia. *Journal of Child Welfare and Social Work*, 14(2), 115–132.

Shlafer, R. J., & Poehlmann, J. (2010). Attachment and caregiving relationships in families affected by parental incarceration. *Attachment & Human Development*, 12(4), 395–415. https://doi.org/10.1080/14616730903417052

UNCRC. (1989). *United Nations Convention on the Rights of the Child*. United Nations. https://www.ohchr.org/en/instruments-mechanisms/instruments/convention-rights-child

UNICEF. (2017). *Children affected by the incarceration of parents: A handbook for professionals*. UNICEF Regional Office for South Asia.

UNICEF Sri Lanka. (2019). *Children affected by incarceration: A situational analysis*. UNICEF Sri Lanka.

UNODC. (2021). *Handbook on children with incarcerated parents*. United Nations Office on Drugs and Crime. https://www.unodc.org/documents/justice-and-prison-reform/UNODC_Handbook_on_Children_with_Incarcerated_Parents.pdf

Wijesekara, M. (2021). *Community-based social work responses to children affected by parental imprisonment in Sri Lanka:* Unpublished manuscript